# සැඳෑවි

சந்தாவ

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
2018 ජූලි - සැප්තැම්බර් කලාපය

## සැඳෑවේ සෝබාව....

*"සෝබන සැන්දෑවේ සීතල මඳ පවනේ*
*ඔබ එනතුරු සිටියා"*

"සැඳෑව" කියන්නෙ දවසේ සුන්දරතම හෝරාව... රන් පැහැති ආකාසෙ... සීතල මඳ පවන.

තමන්ගෙ ප්‍රියයන් හා සාදවෙන්න හොඳම වෙලාව තමයි "සැඳෑව". ඉතින් සැඳෑවේ සුවඳ අපේ ජීවන සුවඳට මුසුකර ගන්න තමයි අපි *"ඇය"* එනතුරු බලා ඉන්නෙ.

*"සුවඳ මලේ පෙම් කුසුමේ ඇයි ඔබ තව නාවේ*
*අඳුරද ලොව පැතිරේ..."*

අමුතුවෙන් එන්න දෙයක් නැහැනෙ.. *"ඇය"* ඒ සුවඳ මල අපි ළඟමයි ඉන්නෙ.. ඉතින් කවුද මේ *"ඇය"* කියන්නේ. ඇත්තටම *"ඇය"* සුවඳ මලක්ම තමයි.

ඒ තමයි අපේ *සුන්දර අතීතය.*

ළමා-තරුණ-වැඩිහිටි ඈ නෙක ජීවන පරාසයන් එක හුයකින් ගැට ගහගෙන *"ඇය"* අපේ සිත් තුලට කිඳ බහින්නෙ අපූරු සිතුවම් පටයක් වගෙ.

දුක.. සතුට.. ජය පැරදුම.. ඇතිවූ නැතිවූ පෙම් කතා... ඔක්කොම ඒකෙ පිරිලා.

*"හිරු දෙව්ඳු මුහුදෙ ගිලී බැසයයි අප හැරදා*
*ඔබ කොතැනද සොඳුරේ..."*

හිරු ඔහේ බැස ගියාවෙ. *"ඇය"* අපි ලඟම මේ ඉන්නෙ.. අපි *"ඇය"*ට තවත් තුරුළු වෙමු... දැන් ඇගේ සුවඳ අපිට හොඳට දැනෙනව.

හැබැයි ඒ සුවඳෙ අමුතු විශේෂ සුවඳකුත් දැනෙනවා නේද?... මො..ක..ක්..ද.. ඒ.

ඒ තමයි.. අපේ මහ බැංකුවෙ සුවඳ..



සහෝදර සහෝදරියො පිරිවරාගෙන.. දශක කීපයක්ම... එකම වහලක් යට... රංඩු වෙවී.. යාළුවෙවී.

අපිට පුළුවන්ද ඒ සුවඳ කවදාවත්ම අමතක කරන්න. ඉතින් දැන් ඒ සුවඳ යම් පමණකින් හරි විඳගන්න පුළුවන් එකම *"තෝතැන්න"* තමයි *මහ බැංකු විශ්‍රාමික සංගමය.*

හැකි හැම මොහොතකම අපි ඒ *තෝතැන්නට එකතුවෙමු....*

**එතැන හරිම සුන්දරයි... හරිම සුන්දරයි...**

# වියෝවූ අප සොයුරු සොයුරියෝ

**(2017/2018)**


**අදරින් සමරමු අප නිතියෙන්**
**වෙන්වූ ඔබ සැම අප අතරින්**

එන්.එස්. විජේපාල මයා 933
පී.එම්. හසන් මයා 193
එම්.පී. පෙරේරා මයා 453
ආර්.පී. චන්ද්‍රසේන මයා 950
ආර්. රණසිංහ මයා 1376
ඒ.එස්. ජයවර්ධන මයා 597
එස්.ආර්.එම්. සිරිසේන මයා 751
සී.ඊ. ජයසූරිය මයා 635
බන්දුල ප්‍රිය විමලසූරිය මයා 938
එස්. කරුණාරත්න මයා 683
ඩබ්ලිව්.එම්. සිරිවර්ධන මයා 1038
එස්.එන්.සී. සත්තියාගු මිය 519
පී. සුන්දරනාදන් මයා 795
ආර්.ඒ.එස්. පෙරේරා මයා 3383
බී.පී. කොට්ටච්චි මයා 396
වී.එස්.ඩී. මෙල් මිය 3299
අයි.එස්. ලේබා ගුණසිංහ මිය 3077
ඩබ්.ජී. චන්ද්‍රසේන මයා 818
එස්.පද්මා එස්. ගුණසේකර මිය 852


අප කාරක කමිටුවේ උප සභාපතිවරයෙකු ලෙස කටයුතු කළ **ඩී.ඩී.ඒ. ධර්මකීර්ති** මහතා අනපේක්ෂිත මොහොතක නොබෝදා අප අතරින් වියෝ විය.

ඔහු මහ බැංකු සේවාවට එක්වන්නේ 1988 වසරේදී පුහුණු වැඩ කටයුතු දෙපාර්තමේන්තුවෙනි. ඉන්පසු සංවර්ධන මුදල් බැංකු සංවර්ධන ණය, ව්‍යවහාර මුදල්, ලේකම්, ප්‍රාදේශීය සංවර්ධන යන දෙපාර්තමේන්තුවල සේවය කර ඇති අතර බැංකු සේවාවෙන් විශ්‍රාම යන විට ඔහු පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරමින් සිටියේය. අප විශ්‍රාමික සංගමයේ කටයුතුවලට ඔහු ලබාදුන් ක්‍රියාකාරී සහයෝගය මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරමු.

ධර්මකීර්ති සොහොයුරාණෙනි ! ඔබට නිවන් සුව !



# මෙන්න... අපේ හපනෙක්...



# ලංකාවේ... එක ආසියාවේ... දෙක ලෝකයේ... නවය

# කවුද මේ ?

රත්නපුර, නිවිතිගල සුමන මහා විද්‍යාලයෙන් සරසවි වරම් ලැබූ ප්‍රථම ශිෂ්‍යයා වශයෙන් ඉතිහාසගත වෙමින් පේරාදෙණිය සරසවියට (එකල ලංකා විශ්ව විද්‍යාලයට) ඇතුලු වූ අප සාමාජික **ඇම්.වී.ඒ. ජයරත්න** අද වන විට දේශීය මෙන්ම ජාත්‍යන්තරයේද නමක් දිනා ඇති ප්‍රවීන මලල ක්‍රීඩකයෙකි. මොහු 1966 වසරේ බැංකු සේවයට බැඳී තිස්පස් වසරක සේවාවෙන් පසු විශ්‍රාම ලබන විට බැංකු අධීක්ෂණ දෙපාර්තතමේන්තුවේ මාණ්ඩලික පංතියේ (III වැනි ශ්‍රේණිය) නිලධාරියෙකු වශයෙන් සේවය කරමින් සිටියේය.

පාසැල් සමයේ සිට මේ දක්වා අඛන්ඩව මලල ක්‍රීඩාවේ නිරත වන මොහු වයස අවුරුදු 70-74 වයස් කාණ්ඩයේ මීටර් 200, මීටර් 80 කඩුලු මතින් දිවීම හා මීටර් 300 කඩුලු මතින් දිවීම යන තරග ඉසව් තුනේම ශ්‍රී ලංකා වාර්තාවකට හිමිකම් කියයි. රාජ්‍ය සේවා මලල ක්‍රීඩා තරගවලදී හා සමස්ත ලංකා ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරග ඉසව්වලින් මේ දක්වා ලබා ඇති රන්, රිදී, ලෝකඩ පදක්කම් සංඛ්‍යාව සියය ඉක්මවයි. එසේම එම වයස් කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලාන රැසක්ද මෙම තරගවලදී දිනාගෙන ඇත. දේශීය මට්ටමින් ඔබ්බට ගිය මොහු තායිලන්තය, මැලේසියාව, සිංගප්පූරුව, තායිවානය හා චීනය යන රටවල පැවති ආසියාතික ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරඟාවලි රැසකටම සහභාගී වී මව් රටට පදක්කම් රැසක් ගෙන ඒමට සමත්වී ඇති අතර 2016 වසරේ ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර පැවති 22 වැනි ලෝක ප්‍රවීනයන්ගේ මලල ක්‍රීඩා තරඟාවලියේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට වරම් ලැබීය. 2018 වසරේ සැප්තැම්බර් මාසයේදී ස්පාඤ්ඤයේ පැවැත්වුන 23 වැනි ලෝක ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරඟාවලිය සඳහා සුදුස්සන් තේරීමේ තරඟාවලිය පසුගිය ජූනි මාසයේදී සුගතදාස ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. එහිදී අවුරුදු 70-74 වයස් කාණ්ඩයේ ක්‍රීඩා කළ ජයරත්න ක්‍රීඩකයා මීටර් 100, මීටර් 200, මීටර් 80 කඩුලු මතින් දිවීම හා මීටර් 300 කඩුලු මතින් දිවීම යන තරග ඉසව් හතරින්ම දිවයිනේ ප්‍රථම ස්ථානය දිනා ගනිමින් ලෝක තරඟාවලියට සුදුසුකම් ලැබීය. මෙහිදී මීටර් 200 තත්පර 31..4 කින් නිමකොට නව ශ්‍රී ලංකා වාර්තාවක් බිහි කළ අතර මීටර් 300 කඩුලු මතින් දිවීමේ ඉසව්ව තත්පර 61..4 කින් නිමා කොට තමා විසින්ම කලින් තබා තිබූ ශ්‍රී ලංකා වාර්තාව නැවත අලුත් කිරීමට සමත් විය. කෙසේ වෙතත් ස්පාඤ්ඤයේ පැවැත්වෙන ලෝක තරඟාවලිය සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවන බැවින් මොහු එම තරඟාවලියට සහභාගී නොවීමට තීරණය කළේය.

2017 සැප්තැම්බර් මාසයේ චීනයේ රුගාඕ නගරයේ පැවැති 20 වැනි ආසියාතික ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරඟාවලියේදී තමා සහභාගී වූ ඉසව් 03 ම ජයග්‍රහණය කරමින් මීටර් 200 හා 300 කඩුලු මතින් දිවීමේ ඉසව් සඳහා ආසියාවේ දෙවැනියා බවට පත් වී රිදී පදක්කම් ද මීටර් 80 කඩුලු මතින් දිවීම සඳහා ලෝකඩ පදක්කමද මොහු විසින් දිනාගෙන ඇත. මෙහිදී මීටර් 300 කඩුලු මතින් දිවීමේ රන් පදක්කම තත්පර 03 කින්ද මීටර් 200 තරඟ ඉසව්වේ රන් පදක්කම තත්පර 25 කින්ද අහිමි වී ඇත.

2016 ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර පැවැත්වූ 22 වැනි ලෝක ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරඟාවලියට සහභාගීවීමට අවස්ථාව ලැබීම මොහුගේ ක්‍රීඩා ජීවිතයේ අමරණීය සිද්ධියකි. එහිදී මීටර් 80 හා මීටර් 300 තරඟ ඉසව් දෙකේදී ලෝකයේ නවවැනි ස්ථාන දිනා ගැනීමට සමත් විය. මීටර් 100 තරඟ ඉසව්වේ 15 වැනි ස්ථානය හිමි වුවද එහිදී ආසියාව නියෝජනය කළ චීන හා ඉන්දීය ක්‍රීඩකයින් දෙදෙනා අභිබවා යාමට ඔහු සමත් විය. ඊට අමතරව ඕස්ට්‍රේලියානු තරඟකරුවන් තිදෙනෙකු හා ඇමරිකානුවෙකුද ඔහුට පසුපසින් තරඟය නිම කොට ඇත.

ජයරත්න ක්‍රීඩකයාගේ මහ බැංකු ක්‍රීඩා දිවිය ආරම්භ වන්නේ 1966 දී එකල ගාලු මුවදොර පිහිටි යුධ හමුදා ක්‍රීඩා පිටියේ පැවැති අන්තර් දෙපාර්තමේන්තු මලල ක්‍රීඩා තරඟාවලියට එක් වීමෙනි. එහිදී කඩුලු මතින් දිවීම හා බාධක දිවීමේ තරඟ ඉසව් දෙකින් ජයග්‍රහණය ලැබීය. වින්සන්ට් ප්‍රනාන්දු, කේ.ඩී. ජිනරත්න, රොබට් අල්විස්, ධනසිරි, පී.එම්. බාලසූරිය, ස්පෙන්සර් බ්‍රවුන් යන ක්‍රීඩකකයන් මෙම තරඟාවලියේදී දස්කම් දැක්වූවන් වශයෙන් ඔහුගේ මතකයට නැගේ. මලල ක්‍රීඩකයකු පමණක් නොව බැංකු ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලැබූ පිහිනුම් තරඟාවලියේදී තමා සහභාගී වූ ඉසව් හතරම ජය ගනිමින් එම වයස් කාණ්ඩයේ දක්ෂතම පිහිනුම් ක්‍රීඩකයාට හිමි කුසලානයද දිනා ගැනීමට ඔහු සමත් විය.

එසේම ඇපකැපවීමෙන් හා කාර්යක්ෂම තම සේවාව ඉටුකළ බැංකු නිලධාරියකු වශයෙන්ද ඔහුව හැඳින්විය හැකිය. එසේම, පාකිස්ථානය, සිංගප්පූරුව, මැලේසියාව, ජපානය, හොංකොං, ඇමරිකාවේ ලෝක බැංකුව හා ඇමරිකානු රාජ්‍ය බැංකුවේ පුහුණු පාඨමාලා සඳහා මොහුව යොමු කිරීම ඊට උදාහරණයකි.

මෙම ක්‍රීඩකයා විසින් මෙතෙක් ලබා ඇති ජාතික සහ ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ඔහුට පමණක් නොව අපට ද **ආඩම්බරයක් නොවන්නේද? සැබවින්ම ඔව්.**

# පුතේ... බුදු වෙයන්



දොයි දොයි දොයිය     බබා
බයි බයි බයි බයිය     බබා

දස මස් කල් කුසේ     දරා
දුක් ගින්දර හිතේ     දරා
ඔබ වැඩුවෙමි සෙනෙහෙ     ළයේ
දස දුක් විඳ දිවා     රැයේ

උදේ රැයින් ගෙන්     පිටවී
තාත්තා එයි මග     ලතැවී
හිගා නොකා හිගා     කකා
ඔබ වැඩුවෙමි දුකින්     මකා

ඉනට වතක් නැතිව     පුතේ
කණට තෝඩු නැතිව     පුතේ
කුසට අහර නැතිව     පුතේ
ඔබ දැඩි කළ මඟ     දෑතේ

අකුරට ගොස් මඟ     එනතුරු
සිටියා ඔබ ලොකු     වෙනතුරු
සරසවි දෙව් වරම්     ලබා
ගියා නොවෙද අප     තනිකර

සත් රුවනින් මහල්     තනා
දැසි දස්සන් සපිරි     වරා
අඹේනියක් සමගින්     ඔබ
වැජඹෙන වග ඇසිමු     පුතේ

පියා ඔබේ මරු කට     ලඟ
මෑණි ඔබේ මරු කට     ලඟ
ලගයි දෙනෙත් පිය     වෙන්නට
පතමු පුතා බුදු     වෙන්නට

**ආචාර්ය සළුන් විජේසිරි**
0777-119177

# වංචනික අලෙවිකරණය



✵ මේ දෙදහස් දහඅටේ ජූලි මස 10 දාය. වේලාව උදේ 10.30

''අංක 503 B 4 අංකය මෙහෙද?''
''ඔව්''
''මිස් ප්‍රශාවතී මෙහෙද?''
''ඔව් ඒ මගේ දුව''
''එයාට පාර්සලයක් තියෙනවා අපි කූරියා සර්විස් එකකින්. මේකට අත්සන් කරලා ගන්න''

මම එයට අත්සන් කර පාර්සලය ලබා ගැනීම සඳහා අත දිගු කළෙමි.

''රු. 1200/- ඕනෑ'' ඔවුන් ප්‍රකාශ කලා.

''ඒ මොකටද? මොකක් ද පාර්සලය? මොනවද ඒකෙ තියෙන්නේ? කොහෙන්ද ඒක එවලා තියෙන්නේ?'' මම ඇසුවෙමි.

''මේක ප්‍රශාවතී අන්තර්ජාලයෙන් ඕඩර් කරපු මූනේ ගාන ක්‍රීම් එකක් ඒකේ මිල තමයි සටහන් කරලා තියෙන්නේ''

ඒ සමඟම දුව මගේ බිරිඳට දුරකථන ඇමතුමක් දී පාර්සලයක් ආවොත් ගන්න යැයි පවසා ඇත. එම නිසා තවත් ප්‍රශ්න නොකරම අදාල මුදල ගෙවා පාර්සලය ලබා ගෙන ඒ අය පිටත් කර හැරියෙමි.

✵ මේ සිද්ධිය පිළිබඳව කල්පනා කරන අතරතුර මීට වසර 30 කට පෙර මටම සිදුවූ තවත් සිදුවීමක් මා හට සිහිවිය. ඒ එක්දහස් නවසිය අසූ අට වසරේ එක් දිනයකි. මම වැතැම් වීදියේ කාර්ගීල්ස් සාප්පුව ඉදිරිපිටින් ඇවිදිමින් සිටියෙමි. පසු පසින් පැමිණි අයෙකු මගේ පිටට තට්ටු කරමින් මා ඇමතීය.

''කොහොමද යාළුවා ආය රස්සාව හම්බවුනාද? පරණ තැනමද වැඩ කරන්නේ?''

''ඔව් මට අවුරුදු තුනකට පස්සේ ආය රස්සාව හම්බවුනා''

1980 ජූලි වැඩ වර්ජනය නිසා රැකියාව අහිමි වූ පිරිස අතරින් දුක සේ ජීවත් වූ අයගෙන් තවත් අයෙකු යැයි උපකල්පනය කල මා ඔහුට දෙවරක් නොසිතා පිළිතුරු දුනිමි.

''මට තවත් රස්සාව හම්බවුනේ නැහැ. ළමයින් ජීවත් කරන්න මම හකුරු ටිකක් හදලා දන්න අඳුනන අයට දීලා උදව්වක් අරගෙන ඔහේ ජීවත් වෙනවා. පුළුවන්නම් මේකෙන් හකුරු කෑලි කීපයක් අරගෙන උදව්වක් කරන්න.''

මා වැඩවර්ජනය සමයේ රැකියාව නොමැතිව ගතකළ දුෂ්කර ජීවිතය සිහිපත් කරමින් හකුරු මුල් දෙකක් ගෙන රු. 500/- ඔහු අත තැබීමි. නිවසට ගොස් පරීක්ෂා කර බලන විට පොල්කටු අඟුරු හා අපද්‍රව්‍ය මිශ්‍ර එම හකුරු ආහාරයට ගත නොහැකි නිසා වීසි කර දැමුවෙමි. වංචා කරුවෙකුට හසු වූ බව දැන ගත්තේ එවිටය. පසුව කල්පනා කරන විට මතකයට ආවේ ඔහු හමුවීමට සුළු වේලාවකට පෙර මාගේ වෙනත් යහළුවෙකු හමුවී වැඩ වර්ජනය හා නැවත රැකියාව ලැබීම පිළිබඳව අතර මගදී කථාබහේ යෙදී සිටි බවත් ඔහු එයට රහසින් සවන් දී සිටින්නට ඇති බවත් පසුව මා පසු පස විත් මා අන්දවා ඇති බවත්ය.

✵ මෙයටම සම්බන්ධ තවත් සිද්ධියක් තවමත් මගේ මතකයේ ඇත. ඒ එක්දාස් නවසිය හැත්තෑ අටේ අගෝස්තු මාසයේ එක්තරා දිනයකි.

''ගුඩ් මෝනිං මිස්ට අතපත්තු''

''ගුඩ් මෝනිං කමලාවතී මැඩම්''

උදැල්ල කර තබාගනිමින් කුඹුරට යාමට මිදුලට බසිමින් සිටින මාගේ පියාටත් මිදුල අතුගාමින් සිටි මගේ මවටත් ඔවුන් මවිතයට පත් කරමින් එදා එසේ ආමන්ත්‍රණය කලේ අත් දිගට දාලා ටයි එකක් දාලා සපත්තු දාපු ලස්සන තරුණ

මහත්තයෙක්. එහෙම කෙනෙක් මිස්ට/මැඩම් කියල උදේ පාන්දරයම කථා කරන කොට ඕනෑම කෙනෙකුට හිතෙනවා ඒ අයටත් වඩා අපි මහත්වරු කියලා. එතකොට ඒ අය කියන ඕනෑම දෙයක් අහන්න පෙළඹෙනවා. ''අපි .................... රක්ෂණ සමාගමෙන් රු. 500/- මාසයකට ගෙව්වාම ඒකෙන් රු. ලක්ෂ පනහක ජීවිත රක්ෂණ ආවරණ මුදලක් මුලු පවුලේ සියළුම සාමාජිකයින් ට ලැබෙනවා. ඒ සමාගම වෛද්‍ය ප්‍රතිලාභ මුදල් අසීමිතව මුලු පවුලටම ලැබෙනවා. අද පමණක් විශේෂ ප්‍රමෝෂන් එකක් විදිහට50% ක වට්ටමක් දෙනවා. එම නිසා මෙම ඉල්ලුම්පත පුරවා මෙම වසර සඳහා රු. 3000/- ක් එකවර අදමගෙවීමෙන් එම විශේෂ වාසිය නොපමාවලබා ගන්න.'' යැයි මාගේ පියාට හා මවට පවසා ඇත.

''බොහොම ස්තූතියි. අපි ලඟ ඔබට දෙන්න දැන් සල්ලි නැහැ. කොහොමත් ඒ ගැන අපි පුතාගෙන් ඔය ගැන අහන්න ඕනෑ. පුතා වැඩ කරන්නේ මහ බැංකුවේ. එයාට අපි වෙනුවෙන් ඔය කියන හැම දෙයක්ම මහ බැංකුවෙන් ගෙවනවා. එම නිසා අමුතුවෙන් රක්ෂණයක් අපට අවශ්‍ය නැහැ.''

මහත්වරු කිසිත් නොකියා හිමින් සීරුවේ යන්නට ගියෝය.

**යුග තුනක අලවිකරණයේ අවස්ථා තුනක් පිළිබඳ සිද්ධි තුනක් ඉහතින් දැන්වූයෙමි. ඉන් සිතා මතා වඩාත්ම බුද්ධිමත් තීරණය ගන්නේ පරම්පරා තුනෙන් කව්ද? ඔබම තීරණය කරන්න. මගේ දුවද? මමද? නැතහොත් අඩු අධ්‍යාපනයක් ලැබ සරල ජීවිතයක් ගත කළ අඩු අවශ්‍යතා සහිත මගේ මව හා පියාද?**

**ඒ.ඩබ්.යූ. ටිකිරි බණ්ඩා (0714433056)**

**සංගමයට එවන විශේෂ ලිපි :**

**ආරියදාස තන්ත්‍රීගේ (ලේකම්)**
**104/8, කුරේ පෙදෙස,**
**ස්ටැන්ලි තිලකරත්න මාවත,**
**නුගේගොඩ.**



# ගොපලු හඬ

පින්න මැදින් මල් පීදෙන අරුණැල්ලේ
මීමුන් සරති වෙල් එළියේ ඉපනැල්ලේ
ගොපලු කොලුගෙ බට ලී හඬ නැලවිල්ලේ
ගම්මානය නැලවෙයි මල් ඕවිල්ලේ

කන්ද උඩින් හිරු බැස යන වෙලාවේ
හෙන්දිරික්ක මල් පිපිලා හිනාවේ
ලාලනියක් දියට ඇදෙන කලාවේ
ඇසුනා හඬක් ගොපලුගේ බට නලාවේ

ඇල්හේනට පුරහඳ පායන කලට
මල් බඹරිඳු වඩියි රෑ පුදින මලට
නින්ද නොයන රෑ යාමේ තනි පැලට
බට ලී හඬ පමණි රැඳුනේ තනි කමට

ගංතීරේ උණ පඳුරේ සෙවනෙ හිඳ
වැයූ ගී මිහිර සඳහට ගොලුවී යාද
මේ සුන්දර දසුන් අමතක වී නිබඳ
සරසවි මවුනි ඔබ කොයිබක තනිවීද

ඩිජිටල් තාක්ෂණයෙන් ලොව කැලඹුනාදෝ
ෆෝන් සෙල්ෆියෙන් මන සෙලවුනාදෝ
ගම්බද සොඳුරු බව වල් වැදුනාදෝ
වස්දඩු රාවේ කොතැනක සැඟවුනාදෝ

**දිබ්බැද්දේ දුල්මන් පීරිස්**
දු.ක : 0382245263 / 071 5967339

# ස්වභාව ධර්මයේ අපූරු නිර්මාණයක්

# වවුල්පනේ හුණුගල් ගුහා



රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්නා කෝරළයේ කොළොන්නා ගම් පත්තුවේ කුඹුරාගමුව වසමේ පිහිටි වවුල්පන ස්වභාවික හුණුගල් ගුහා මේ වන විට ඔබ අසා හෝ නුදුටු ස්ථානයක් විය හැකි යැයි මා සිතමි. එය ස්වභාවික සම්පතකි. ලොව පුරා පිහිටා ඇති හුණුගල් ගුහා වලින් එකකි. මුහුදු මට්ටමෙන් මීටර් 278 (අඩි 912) පමණ උසින් පිහිටා ඇති අතර බුළුතොට හෙල්වල නැගෙනහිර පාමුල පිහිටා ඇත.

එහි ඇති ප්‍රධාන ගුහාව දිගින් මීටර් 457 කි. ගුහාවේ උස එක් එක් ස්ථාන වලදී වෙනස් වේ. හුණුගල් ගුහා තුළ සිත් ඇදගන්නා ගිරිටැඹ හා ගිරිලඹ නරඹන්නන්ගේ සිත් ඇද ගනී. මෙම එල්ලෙන ගිරිලඹ පොළවෙන් උඩට මතුවන ගිරි ටැඹ වෙනස් උසින් සහ වෙනස් වට ප්‍රමාණ වලින් යුක්තය. මේවා මනස්කාන්ත හැඩයන් ගෙන් යුක්ත වන අතර බල්බ හැඩය පැතලි හා ප්‍රතිමා හැඩ ගනී. මෙහි චිත්තාකර්ශනීය දර්ශනයක් වන්නේ වවුල්පන නිම්නය හරහා වලවේ ගඟට ගලා බසින හල්විනි ඔය මෙම ගුහා තුළින් ගලා බැසීමයි. ගුහාව තුළින් ගලා යන සුදු පෙණ සහිත හල්විනි ඔය කුඩා පොකුණු සාදමින් සංචාරකයින්ගේ සිත් ඇදගන්නා පරිදි ගලා යයි.

ඇතුල්වීමේ දොරටුව මීටර් 100 පමණ ඈතින් සහ මීටර් 50 ක් උසින් පිහිටි කිවුල් උල්පත කෙනෙකු මවිතයට පත් කරයි. මෙම උල්පත තරමක් කුඩා වන නමුත් තත්පරයට ලීටර් 26 ක වේගයෙන් අමුතුම පැහැයක් ගන්වමින් මීටර් 37 (අඩි 120) පමණ දුර ගලා ගොස් හුණුගල් ගුහා මධ්‍යයට ඇද හැලී දර්ශනීය අභ්‍යන්තර දිය ඇල්ලක් නිර්මාණය කරයි. මෙම හුණුගල් ගුහා අවුරුදු දස ලක්ෂ ගණනක ඉතිහාසයකට උරුමකම් කියතැයි සැලකේ.

එම කිවුල් උල්පතේ ගලනා ජලයෙන් ස්නානය කිරීමෙන් චර්ම රෝග සුව වන බව එහි නිවැසියෝ විශ්වාස කරති. සමේ රෝග වලට වටිනා ඖෂධ වන කැල්සියම්, කාබනේට් සහ අයන් හයිඩ්‍රොක්සයිඩ් එම ජලයෙහි අඩංගු නිසා මෙය සත්‍යයක් විය හැකිය.

මෙම ප්‍රදේශයට විශේෂිත වන වෘක්ෂලතා සහ සත්ව වර්ග රාශියකි. ශ්‍රී ලංකාවට ආවේණික වූ අධික වෘක්ෂලතා ප්‍රමාණයක් රක්ෂිතය තුළ ඇත. ලෝකයේ මුල්ම මී ප්‍රභේදය, බිං කොහොඹ, වනරාජ ආදී දුර්ලභ ඖෂධ මෙම රක්ෂිතයේ ඇත. හුණුගල් ගුහා වලට කි.මී. 2 ක් පමණ ඈතින් මඩුහේන් යාය නමින් මඩුගස් 3000-4000 පමණ ඇති පහත් බිමක් ද විය. ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂි විශේෂ ද දැකිය හැකිය. හල්මිනි ඔයේ ද ආවේණික මත්ස්‍ය විශේෂ දක්නට ඇත. සිත් ඇද ගන්නා එහෙත් ඇඟ ලොමු ගන්වන වවුල් ගහණයක් මෙම හුණුගල් ගුහා තම වාසස්ථානය කරගෙන ජීවත් වෙති. ඒ දිනවල කරන ලද සංගණනයක් අනුව වවුල් වර්ග 6 ක් වන අතර කෘමි භක්ෂිකයින් ලෙස අනුමාන කර ඇත. මෙහි වෙසෙන වවුල් ගහනය ලක්ෂ 2 1/2 කටද වැඩි බව කියවේ. ඒ හැරුණ විට ගුහා තුළ අපේ සත්ව පරිණාමයේ මුල සිටි කැරපොත්තන් දැලියන් වැනි සතුන් ද ලක්ෂ ගණනින් සිටිති. කටුසු විශේෂ ද විය. වවුල්පන යන නම ලැබී ඇත්තේ ද එහි වෙසෙන ලක්ෂ සංඛ්‍යාත වවුලන් නිසා යැයි සිතමි.

ඉහත කී ස්ථානය නැරඹීමට මට අවස්ථාව ලැබුණේ 2000, 2001 වර්ෂවලදී බව මතකයි. එම හුණුගල් ගුහා නැරඹීමට යාමත් ඉතා දුෂ්කර කටයුත්තකි. ඒ ස්ථානයට නුදුරින් ර/වවුල්පන විද්‍යාලය නැමැති කුඩා පාසලකුත් තිබුණා. එහි විදුහල්පති තුමා දැනුවත් කර එහි ගිය නිසා අපට

සියලු දේ සූදානම් කර තිබුණා. ගුහාව තුළ සමහර ස්ථාන තරණය කිරීමට ඉණි මං බැඳ තිබුණා. ඒවා ඉතා ශක්තිමත්ව සාදා පැට්‍රොල්මැක්ස් ලාම්පු රැගෙන කිහිප දෙනෙක් අප සමඟ ගියා. අප ඒ ඉණිමං වලින් එතෙර වීම සඳහා උදව් කිරීමට පිරිමි ළමයින් කිහිප දෙනෙක්ම සිටියා. ඒ තුළ සුන්දර අත්දැකීමක් වුවත් එහි යෑමට පෙර නෑමට සූදානම් විදියේ ඇඳුම් ඇඳීමට සිදු වුණා. එහි තුළ එක් ස්ථානයක වවුලන් පිරී සිටියා. අපට ඇවිද යාමට සිදු වුණේ අඟ 5- උසට තිබූ වසුරු ගොඩක. එම ගුහාවෙන් පිටතට පැමිණෙන විට නිල්වන් ජලය පිරි ලස්සන ස්වභාවික පොකුණක් තිබුණා. වවුල් වසුරු උඩ ඇවිදිමින් හිසේ පටන් වවුල් වසුරු නාගෙන එළියට ඇවිත් අර පොකුණෙන් හොඳට නෑවා. ඊට මඳක් නුදුරින් පරණ තාලයේ තේ කඩයක් තිබුණා. එහි දී විස්කිරිඤ්ඤා කා උණු උණුවේ කහට තේ බීවා. එදින රාත්‍රිය ගත කිරීමට සිදු වුණේ ඒ කුඩා පාසලේ කෘමි සතුන් පලවා හැරීමට විශාල ගිනි මැලයක් දැල්වූවා. ගිනි මැලය වටා හිඳ රැය පහන් කරගෙන උදේ ගම්බිම් බලා පිටත් වුණා.

<u>මේ ස්ථානය වෙත යෑමට මාර්ග විස්තර :</u>


1. රත්නපුර-ඇඹිලිපිය පාරේ පල්ලෙබැද්ද තුංතොට හංදියෙන් හැරී බුළුතොට මාර්ගයේ කි.මී. 10 පැමිණ වවුල්පන සංවර්ධන මාවතේ සිට විදුහල දක්වා කි.මී. 2 ක් පාගමනින්.

2. ඇඹිලිපිටිය-සූරියකන්ද පාරේ බුළුතොටින් හැරී පල්ලෙබැද්ද පාරේ කි.මී. 14 පැමිණි විට වවුල්පන සංවර්ධන මාවතේ කි.මී. 2 පා ගමනින්.

ර/වවුල්පන විද්‍යාලය, හල්වින්න, ගොඩකවෙල.

**හේමා විමලසෝම**
0112614717
0718328627

# Effects of plastic in Global Warming



## Do you know?

That 18 billion pounds of plastic ends up in the Ocean each year and that is just the tip of the Iceberg.

However, it is not that bad if it is managed systematically. We can recycle this trash into treasure. (Issue of National Geographic Magazine (06-2018/Volume 5 - Issue II)

## A Toll on wild life

Animals eat it, get stuck and die from it. For them, plastic is turning the Ocean into a mine field.

My opinion is that The Oceanic Paradise is turning into a Death field due to human misbehaviour. We made it, we depend on it. We are drowning in it.

## Toll on wildlife

On a boat off Costa Rica, a biologist uses pliers from a Swiss Army Knife to try to extract a plastic straw from a sea turtles nostril.

The turtle writhes in agony bleeding profusely for eight painful minutes. You tube video ticks on, it has logged more than 20 million views even though it's so hard to watch. At the end increasingly desperate Biologists finally managed to dislodge a four inch long straw from the creature's nose.

Raw scenes like this which lay bare the toll of plastic on wildlife, have become familiar. The turtle stuck in a six — pack ring its shell warped from years of straining against the tough plastic.

Among the marine animals sea birds are very badly affected. The irony is that these birds are eating plastic thinking that plastic is their food and finally get drowned in it.

We, human beings, must try our best to save the animals and make use of plastic usefully. It should be recycled. The trash, muck & plastic, managed, systematically is gold & Treasure.

## Global Warming

These muck, thrash and plastic that get into the poles will cause Global Warming, which in turn LAN affect the animal lives in the polar region.


Dr. Harsha Jayawardena, Chief Surgeon in-charge of Mason City, Municipal Clinic, Iowa, USA, the guest speaker discussed of Global Warming on survival of Polar bears and the people of Kaktovik, an Eskimo village at the edge of Arctic National Wild Life Refuge.

He said that scientific research has shown that the break up of the Arctic Sea Ice due to global warming is depriving Polar bears of valuable hunting time needed to survive the ice-free months without food. As a result the hungry Polar bears are being driven to the shore, weeks earlier than usual.

If global warming trends ,continue, it will not be encouraging for these majestic creatures to survive. Scientists think that Polar Bears are unlikely to survive beyond 2060 if warming trends continue.

My opinion is that, thrash, muck &. plastic thrown into the Ocean is affecting the far away Arctic Poles, which in return will speed up Global Warming, and finally affect the precious animal lives in the poles.

**J. Jayawardena**



# මේ මහළු වයසේ

හිස කෙස් පැසී ඇත සුදු පුළුන් වගේ
පණ නැති වී ඇත අඩක් දෙපා මගේ
බෙලහීන කම නිසාදෝ දෑතේ මගේ
හොඳ හැටි දැනෙනවා යොවුන් වියේ අගේ

මතකය අඩුය නැත එය හොඳ පෙරසේම
ගිල දැමුවත් බෙහෙත් තොගයක් හැමදාම
මරණය කල් දැමීමකි වෙන්නේ නාම
එහෙමනෙ ඉතින් සොබාවේ හැසිරීම

උපැස් යුවල නාසය මත රැඳී ඇත
වැහැරී මස් පිඩු ගත සම රැලි වැටී ඇත
ඇවිදින විට දැනෙයි හෙම්හිට වැනෙන ගත
දැනටම පෙර තිබුණු එඩිතර ගතිය නැත

දුක සැප දෙක බෙදාගෙන විඳිමින් සතුට
අවුරුදු පනස් හතරක් එක වහලෙ යට
සිටියත් මගේ බිරිඳ නොකියාම මට
හදිසියෙ ගියානෙ අනේ යලි නේන්නට


අබලන් වී ඇති ඉඳුරන් සමඟ කයේ
මම දැන් කල් ගෙවමි අසූ හතර වියේ
සිහි වෙයි මට බිරිඳ නිතරම දිවා රැයේ
නොදනිමි කිමද ඇය මට නොකියාම ගියේ

තරුණ කල පමණි මට මිතුරන් සිටියේ
සිටින නිසා දැන් ජීවිත බඩ වැටියේ
පතන්නට පෙර මා පිහිට සැර යටියේ
ආසයි යන්න රහසෙම හිටි හැටියේ

පී.බී. අබේයපාල
2868849

# "අන්තිම කැමති පත්‍රයක්"

## (LAST WILL) යනු කුමක්ද?



''අන්තිම කැමති පත්‍රය'' යනු යම් කෙනෙකු ජීවත්ව සිටියදී තමන් මිය ගිය පසුව තම දේපළ (බූදලය) හිමිවිය යුත්තේ කාටදැයි ලියා අත්සන් කෙරෙන ලේඛනයකි. වයස අවුරුදු දහ අටකට වැඩි ඕනෑම තැනැත්තෙකුට අන්තිම කැමති පත්‍රයක් ලියා අත්සන් කළ හැකිය. සිහිවිකල අයකු ලියා අත්සන් කරන අන්තිම කැමති පත්‍රයක් වලංගු ලේඛනයක් ලෙස පිළි නොගනී.

අන්තිම කැමති පත්‍රය නීතියෙන් පිළිගන්නා නීත්‍යානුකූල ලේඛනයකි. ඒවා සස් කිරීම සම්බන්ධව අප රටේ නීතිමය ප්‍රතිපාදන පවතී. **"1884 අංක 21 දරණ අන්තිම කැමති පත්‍ර පිළිබඳ ආඥා පනත"** මේ සම්බන්ධව දැනට බලපවත්නා මූලික පනත වේ. අවුරුදු එකසිය තිහකටත් වඩා වයසැති මෙම මූලික පනත කීපවිටක්ම සංශෝධනය කර ඇත.

අන්තිම කැමති පත්‍රයක් මගින් තමන් සතු ඕනෑම දෙයක් තමන් ජීවත්ව සිටියදී වෙනත් අයෙකුට හිමි කර නොදී තම අයිතියේම තබාගෙන තමන්ගේ මරණයෙන් පසුව හිමිවිය යුතු තැනැත්තකු හෝ තැනැත්තන් හෝ නම් කර තැබිය හැකිය.. තම ඉඩකඩම්, තම නිවාස, තම වාහන, තම බැංකු ගිණුම්වල ඇති මුදල්, තම ගෘහ භාණ්ඩ ආදී ඕනෑම දෙයක් තමන්ගේ මරණයෙන් පසුව බෙදා ගත යුතු ආකාරය අන්තිම කැමති පත්‍රයේ ලියා දැක්විය හැකිය. එහෙත් බැංකු ගිණුම්වල හෝ සමාගම් කොටස් වැනි යම් චංචල දේපළක් සම්බන්ධයෙන් එම දේපළ හිමි අය විසින් තම මරණයෙන් පසු ඒවා හිමි විය යුතු අයකු නම් කර ඇති විටක (නාමිකයකු සඳහන් කර ඇති විටක) අන්තිම කැමති පත්‍රයක කෙසේ සඳහන් වුවද එම දේපළ හිමි වන්නේ එකී නාමිකයන්ටය. උදාහරණයක් වශයෙන් යමකු බැංකු ගිණුමක නාමිකයකු නම්කර ඇති විට ගිණුම් හිමියා මිය ගිය පසු මුදල් ගෙවිය යුත්තේ නාමිකයාටමය.

අන්තිම කැමති පත්‍රය ඉඩම් විකිණීමේ, හෝ තෑගි දීමේ හෝ උකස් කිරීමේ හෝ බදු දීමේ ඔප්පුවක් මෙන් ප්‍රසිද්ධ ලේඛනයකක් නොවේ. එබැවින් එය කිසිදු ආයතනයක ලියාපදිංචි කරන්නේ නැත. එනම් එය රහසිගත ලේඛනයකි.

අන්තිම කැමති පත්‍රයක් ලියා තබන ඕනෑම අයෙකුට තමන් කැමති ඕනෑම අවස්ථාවක එය අවලංගු කළ හැකිය. අන්තිම කැමති පත්‍රය ඉරා දැමීමෙන් හෝ පුලුස්සා දැමීමෙන් හෝ අලුතින් අන්තිම කැමති පත්‍රයක් ලියා අත්සන් කිරීමෙන් මුල් අන්තිම කැමති පත්‍රය අවලංගු වේ.

යමකු අන්තිම කැමති පත්‍රයක් ලියා තිබූ පමණින් එම ලේඛනයේ දැක්වෙන ආකාරයට එම දේපළ නිතැතින්ම අර්ථලාභීන්ට (ලැබිය යුත්තන්ට) හිමිවන්නේ නැත. අන්තිම කැමති පත්‍රයේ දැක්වෙන ආකාරයට දේපළ බෙදා ගත හැකියැයි සමහරකුට සිතෙන්නට පුලුවන. එහෙත් එය එසේ කළ නොහැකිය. අන්තිම කැමති පත්‍රය අදාළ ප්‍රදේශයේ දිසා අධිකරණයට ඉදිරිපතත් කර නඩුවක් පවරා ඒ මගින් දේපළ බෙදාගත යුතුය.. නඩුවේදී එම අන්තිම කැමති පත්‍රය නිර්ව්‍යාජ එකක් බවට ඔප්පු කළ යුතුය. එක් අතකට අන්තිම කැමති පත්‍රයක් ලියා තැබීම යනු එමගින් දේපළ ලබන අය නඩුවකට පටලවා තැබීමක් බව බොහෝ දෙනෙක් නොදනිති.

දෙදෙනෙකුට හෝ කීප දෙනෙකුට හෝ එක්ව වුවද අන්තිම කැමති පත්‍රයක් ලියා තැබිය හැකිය. එය හඳුන්වන්නේ 'හවුල් අන්තිම කැමති පත්‍රය' යනුවෙනි.

යමකු අන්තිම කැමති පත්‍රයක් ලියා අත්සන් කිරීමේදී එය නොතාරිස්වරයකු ඉදිරියේදී

සාක්ෂිකරුවන් දෙදෙනෙක්ද අත්සන් කළ යුතුය. එසේ ඔවුන් එකවිට අත්සන් තැබූ බව අන්තිම කැමති පත්‍රයක් බලාත්මක කළ හැක්කේ එය ලියූ දේපළ හිමියා මිය යාමෙන් පසුවය. අන්තිම කැමති පත්‍රය ලියා අත්සන් කර එය, යම් තැනැත්තකු භාරයේ රහසිගතව තැබිය හැකිය. නැතහොත් අල්මාරියක හෝ පෙට්ටගමක හෝ සඟවා තැබිය හැකිය. අන්තිම පත්‍රකරු මියයාමෙන් පසුව එය සොයාගත් අයකු විසින් මාස තුනක් ඇතුලත අදාළ දිසා අධිකරණයට ඉදිරිපත් කර නඩුව පැවරිය යුතුය. මිය ගිය දින සිට මාස තුනක් ඇතුලත නොව එය සොයාගත් දින සිට මාස තුනක් ඇතුලත නඩු පැවරීම කළ යුතුය. අන්තිම කැමති පත්‍රයක් ලියා ඇති විටක යමකුගේ බූදලයේ දේපළ බෙදී යන්නේ එහි නියමයන් අනුව මිස උරුමය අනුව නොවේ.

මියගිය අයගේ බිරිඳ, සැමියා හෝ වෙනත් කිට්ටුම නෑදෑයන් කවුරුන් සිටියත් ඔවුන්ට අන්තිම කැමති පත්‍රයෙන් දේපළ කොටසක් හෝ වෙන් කර නැතිනම් ඔවුන්ට එම දේපළෙන් කිසිම කොටසකට හිමිකම් නොලැබේ. **මේ අතින් බලනවිට අන්තිම කැමති පත්‍රයක් යනු තම බිරිඳට/සැමියාට දූ දරුවන්ට පවා උරුම විය හැකි දේපළ අහිමි කළ හැකි භයානක ලේඛනයකි.**

**නීතිඥ ජී.ඒ. කරුණාතිලක**
0718185398/0714792603

## පල නොවූ ලිපි

වැටුප් ප්‍රශ්නය පිළිබඳ අදාළ ලිපි හා විස්තර සඳහා පිටු කිහිපයක්ම වෙන්කිරීමට සිදුවීම නිසා අප සාමාජිකයන්ගේ නිර්මාණ සමහරක් මෙහි පලකිරීමට නොහැකි විය.

එම නිර්මාණ ලබන කලාපයේ පලකරන්නෙමු.

**සංස්කාරක**

# ආදරෙයි මං මගේ ටීචර්ට…

**මිහින්තලේ දුෂ්කර ගම් පියසක කුඩා පාසලක කවියා හා දොඩමළු වූ එක දැරියක දෙඩූ වදන් තුළින්…**



නැගිට සැව්ළිඳු හඩට
එන ගමන් පාසලට
නැමී වැව් ඉවුරකට
නෙලා ගත් පියුමක්ය ඔබ මට

කිරි පබළු දැමූ ගෙලට
ලස්සනයි ඔසරියට
ඔබ එද්දි පන්තියට
මහත් සතුටකි අපට

කියනවිට අප ආයුබෝවන්
පංතියේ හැමෝටම වැඩියෙන්
කියමි මම හයියෙන්
මගේ ටීචර්ට ආයුබෝවන්

කලු ලෑල්ලක බිත්තියේ සැදූ
ලියයි ඔබ හුණු කැටයකින් සුදු
දකිමි මම ඔබෙ ඇඟිලි සුදු මුදු
එහෙත් නොදකිමි අකුරු එකකුදු

පාළු වී ගිය කුඹුරු
දිය සිඳුණු වැව් ඉවුරු
දකින මට නිරතුරු
සිහිනයකි ඔබ විසිතුරු

ආදරෙයි මං මගේ ටීචර්ට
මටත් ඕ වගේ උගන්වන්නට
කියා දෙන්නකො අකුරු මට
මටත් ටීචර් කෙනෙක් වෙන්නට

**ගෝමි**
0112926374

# It says in the
# BHAGAWADH GITA



**நமக்கு எல்லாச் செல்வங்களையும் அருளும் இறைவனுக்கு நாம் பூஜைக்கு மலர்களையும், நைவேத்தியத்திற்குப் பழத்தையும் அளிப்பதன் தத்துவம் என்ன?**

*"உண்மையான அன்புடன் எனக்கு ஒரு இலையை, ஒரு பழத்தை, ஒரு மலரை, ஒரு துளி தண்ணீரை அர்ப்பணித்தாலும் கூட அதை ஒரு தூய்மையான மனத்தின் காணிக்கையாக நான் ஏற்றுக் கொள்கிறேன்", என பகவத் கீதையில் கிருஷ்ண பரமாத்மா சொல்கிறார். தட்டு நிறைய பொன்னும் பொருளும் இருப்பது முக்கியமில்லை, மனம் நிறைய அன்பும் பக்தியும் இருக்க வேண்டும். அதுவே முக்கியம்.*

*அழகாக சிருஷ்டிக்கப்பட்ட மலர்களின் வாழ்க்கை குறுகியது. ஆனால் அந்த சொற்ப நேரத்தில் அவை மணம் பரப்பி நம்மை மகிழ்விக்கின்றன. தம்மிடமுள்ள மகரந்தத்தை வண்டுகளுக்குக் கொடுத்து விடுகின்றன.*

*இதே போலப் பழங்களும், மனிதனுக்கும், மிருகங்களுக்கும் பறவைகளுக்கும் உணவாகின்றன. இனிமையுடன் தம்மைக் கொடுத்துத் தியாகம் செய்கின்றன. பறிக்கப்படாமல் போனால், கனிந்து, உதிர்ந்து மண்ணுடன் கலந்து புழு, பூச்சிகளுக்கு உணவாகின்றன. தங்கள் விதையை மண்ணுக்குக் கொடுக்கின்றன.*

*இப்படி மல்ர்களும், பழங்களும் தங்கள் சொற்பகால வாழ்க்கைக்குள் தம்மைப் பலருக்கும் பயன்பட தியாகம் செய்யும் உயர்ந்த குணத்துடன் வாழ்பவை. இத்தகைய தியாக மனப்பான்மைதான் ஒரு பக்தன் பெற வேண்டிய மகத்தான குணம். அதனாலேயே இதைக் குறிப்பதுபோல் மலர்களையும் பழங்களையும் இறைவனுக்கு அர்ப்பணிக்கிறோம்.*

In the Bhagawadh Gita, Krishna tells Arjuna that when a true devotee offers him even a leaf, fruit, flower or a drop of water, I accept I as dedicated offering from pure mind. It is not important to heap a plate to heap a plate with gold and ornaments. What is more important is a heart full of love and *bhakti* (devotion).

The life span of flowers is very short. Yet in that short period they make us happy by spreading their fragrance.

Similarly, fruits sacrifice themselves as food for human beings, animals and birds. If they are left unplucked they ripen and fall to the ground. When they rot and merge with the soil, they become food for insects and worms. The seed becomes another plant.

Flowers and fruits give off themselves for the common good even though they have short lives. We need to cultivate the same spirit of sacrifice. It is to remind ourselves of this, that we offer flowers and fruits to God.

By – **Mrs.Leela Mohanasundaram**
0778378506, 011-2360665

# විශ්‍රාම වැටුප... අළුත්ම තත්ත්වය...

අපේ විශ්‍රාම වැටුපේ අලුත්ම තත්වය කොහොමද...? වැටුප් වැඩි වුණාද...? කීයකින්ද..? දුරකථනය හරහා අපවෙත කෙරෙන විමසුම් නිමක් නැහැ. ඒ විමසුම ඉතා සාධාරණයි. ඒක ඔබේ අයිතියක්. සංගමයේ කාරක කමිටුව හැටියට අපි මේ පිළිබඳව ගත් උත්සාහයත් ඒවායේ ප්‍රතිඵලත් ඔබ වෙත දැනුම්දීමත් අපේ යුතුකමක්.

විශ්‍රාම වැටුප් ප්‍රශ්නය පිළිබඳව අප පාලක පක්ෂය හා කෙරුණු සාකච්ඡාවලදී ඉදිරිපත් කළ ඉල්ලීම් පාදක කොට ගත්තේ ඔබ සැම විසින් (එක සාමාජිකයෙකු හැර) 2018-04-21 දින පැවැති මහා සභා රැස්වීමේදී අනුමත කළ යෝජනාවයි. එහි මූලික කරුණු වූයේ එවකට සිටි අධිපති තුමාද එකගවූ පරිදි විශ්‍රාම වැටුප් වැඩි කිරීමේ ස්ථාවර ප්‍රතිපත්තියක් ඇති කිරීමත්, 2015 වැටුප් තල මත විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීම සහ 2018 මහ බැංකු සේවකයින්ට සිදුකරන වැටුප් වැඩි කිරීමට සමගාමීව විශ්‍රාම වැටුප් 70% දක්වා වැඩි කිරීමත්ය.

මේ පිළිබඳව අප ඉදිරිපත් කළ ලිපි දින පිළිවෙලට පහත දක්වමු.

| | | | |
|---|---|---|---|
| 23-11-2017 | 03-05-2018 | **17-10-2018** | 29-10-2018 |
| 20-12-2017 | 11-10-2018 | 24-10-2018 | |

මෙහි ඉහතින් සඳහන් 17-10-2018 දරන ලිපිය මීට පෙර සැඳෑවේ පළ කළෙමු.

එම ලිපිවලින් අප ඉදිරිපත් කළ කරුණු පිළිබඳව පාලක පක්ෂය හා සාකච්ඡාවක් ලබා ගැනීමට අප ගත් බලවත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස නියෝජ්‍ය අධිපති රණසිංහ මහතා,, මානව සම්පත් අධ්‍යක්ෂ අබේකෝන් මහතා, අතිරේක අධ්‍යක්ෂ ජයතිලක මහතා සහ අධිපති සහකාර අශෝක හඳගම යන මහත්වරුන් සමඟ වරින් වර සාකච්ඡා වට පැවැත්වුනු අතර තුන්වන වරට පැවති සාකච්ඡාව 2018-10-11 දින සිදුකෙරිණි. එම සාකච්ඡාවලට බඳුන් වූ කරුණු මත අධිපති තුමන් හා සාකච්ඡාවක් ලබාදෙන ලෙස අප කළ ඉල්ලීම මත 29-10-2018 දින අධිපතිතුමන් සමගද සාකච්ඡාවක් පැවැත්වීමට අපට හැකිවිය.

මෙම සාකච්ඡාවලදී පාලක පක්ෂය තුළින් ප්‍රකාශ වූ ප්‍රධාන කරුණක් වූයේ 2015 වසර මත යාවත්කාලීන කිරීමක් කිසිසේත් ඉටුකළ නොහැකි බවයි. අධිපතිතුමා සමඟ කරන ලද සාකච්ඡාවලදී ප්‍රකාශ වූයේ වසර 2000 ට පෙර විශ්‍රාමිකයින්ට ඉතා හොඳ සතුටුදායක වැටුප් වර්ධකයක් ලබාදෙන බවත් අනතතුරුව විශ්‍රාම ගිය වසර මත පදනම්ව ක්‍රමයෙන් අඩුවී යන ප්‍රතිශතයන් මත සෙසු අයට විශ්‍රාම වැටුප් වැඩිවීමක් ලබා දෙන බවත්ය.

ලබාදෙන එකී ප්‍රතිශතයන් කුමක්ද යන්න මෙහිදී ඍජුව ප්‍රකාශ නොවූ අතර පසුව කමිටුව විසින් දුරකථනයෙන් කළ විමසුමකට ප්‍රතිචාර වශයෙන්, ලබාදීමට බලාපොරොත්තුවන ප්‍රතිශතයන් පිළිබඳව සඳහනක් කරන්නට යෙදුණි. එම ප්‍රතිශතයන් ලිඛිතව අපවෙත ලබාදෙන ලෙස අප විසින් ඉල්ලීමක් කරන ලදි. එම ඉල්ලීම මෙතෙක් ඉටු නොවීය. මෙම තත්වය යටතේ අප වෙත ලබාදීමට කැමැත්ත පලකළ ප්‍රතිශතයන් සමහර විට වෙනස්විය හැකි බවටද සැකයක් මතුවී ඇති හෙයින් එම විස්තර ඔබ වෙත නිල වශයෙන් ප්‍රකාශ කිරීමට නොහැකි තත්ත්වයකට අප මුහුණ පා සිටියෙමු.

කෙසේ වෙතත් මේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය පිළිබඳව අප ගෙන යනු ලබන ක්‍රියාදාමය අත් නොහැර ඉදිරියට ගෙන ගියෙමු.

අප හා පාලක පක්ෂය අතර කෙරුණු සාකච්ඡාවලදී අප විසින් මූලිකව ඉදිරිපත් කළ කරුණු පිළිබඳව ඔබහට වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවන පරිදි අධිපතිතුමා වෙත යොමු කළ ලිපි අතරින් සියළු කරුණු සම්පිණ්ඩනය වූ වැදගත් ලිපි තුනක් ඔබගේ දැන ගැනීම සඳහා මේ සමඟ ඉදිරිපත් කර ඇත්තෙමු.

17.10.2018

Dr. Indrajith Coomaraswamy,
The Governor,
Central Bank of Sri Lanka,
Colombo 01.

Dear Sir,

**Rectification of Pension Anomalies - 2018.**

We greatly appreciate and thank you for the discussion you had with us on 11th December2017. Furthermore, you accepted that it was a good thing to have a policy with regard to increase of pension.Our proposal to have a policy to grant 70% of the salary increases of incumbent employees to pensioners.The Salaries and Cadre Review Commission (Presently, National Salaries Commission) Recommended to maintain the pension of a pensioner, at least 70% increase of the government servants in service. Our request was that this should be made after the updating pension to the level of the year2015 of the salaries of present employees. Thereafter, grant pensioners 70% of the salary increase granted to CBSL employees in 2018.

Sir, in your absence we had a round of discussion with Deputy Governor Mr.Ranasingha on 11th October 2018.The discussion was very cordial. At the beginning of the discussion we were made to understand that the updating of pension to the level of year 2015 was not considered and they had deviated from the policy of updatingwhich was accepted in the year 2015 and updated the pension to the year 2006. This was done according to the P.A. Circular No. 16/2015 of 25th June 2015. This was done on a structured basis, depending upon the Class, Grade and the Service period of a pensioner.

We placed before D.G.(R) the following facts for consideration.

1. We pointed out that the Governor agreed and accepted that it was a good thing to have a policy, when we met him on 11th December 2017.

2. By 1997, the Central Bank had decided to grant salary increases in every three years. And increases were granted in 1997,2000,2003,2006,2009,2012,2015, and 2018.The Government updated pension of public sector in 2004, and 2006.

3. As stated above Central Bank also updated the pension to 2006 in 2015.Now we are in 2018 and last updated was in 2006. Therefore this was done twelve years ago, and now it is time to have another updating of the pension.

4. The Central Bank was recorded losses in 2014 and 2015. CBSL recorded a loss of Rupees billion 32 in 2015 and granted big increases to incumbent employees and updated the pension to 2006. In 2017 CBSL recorded a profit of Rupees billion 48. Therefore, we hope, there will be no issue in granting of both our requests. I.e. updating of pension and granting of 70% of the salary increase given to present staff. These figures are taken from the annual reports published by the CBSL.

5. The total expenditure on present staff and pensioners in 2016 was Rupees billion 6.3 while in 2017 it was down to Rupees billion 5.4. One of the reasons is passing away of our members and the reduction of pension and payment of medical benefits paid to pensioners who passed away. These statistics show that it is very reasonable to grant our request.

6. Some of the senior pensioners receive a basic pension much less than the C.O.L.

7. If you compare a basic pension of a Deputy Governor who retired in 2009 (Prior to 2009 salary increase), receives a pension three times less than a salary of a Deputy Governor. Furthermore, his pension is much less than a Staff officer Grade I who retired after 2015.

8. Most of our members are above the life expectancy age of 72 years.More than 50% of the members have passed this age, And 40 to 60 members pass away every year. Even if you give the pension increase now, by the year 2035 nobody will be living to avail the pension and you will have a zero value in payment of pension. Due to this reason although at the beginning it might show a big amount, when time passes value will become less and less and become zero.

9. We note these are the people who struggled and laid their lives to get all the benefits that present employees are enjoying now. These men and women were raised the bank in difficult times. Those are Fire in the bank in 1968, Insurgency in 1971 and 1989,and bomb blast in 1996.During their time they did not have the luxury of modern technology to work and did work under much harder condition. Their effort made a significant growth in the Central Bank during past.

10. We all have to purchase goods in the market at a same rate, such as rice, vegetables, meat, medicine, petrol and diesel, sugar etc.

11. Old age sicknesses cost is very high. They have to employ attendants paying large amounts

Sir, we are of the view that this is the last chance that we have to adopt a policy with regard to the payment of pension. The policy of Updating of salary has been accepted in 2015 and pension was updated to 2006. This updating was twelve years ago and high time you consider updating the pension to a designated year and there after increase the pension to 70%, of the salary increase given to present staff of the Central Bank and make it the policy for future increases. Please be kind enough to grant us an interview as early as possible.

Thanking you,
Yours Faithfully,

Jayalal Jayawardena
President
C.C.D.G (R)

Dr. Indrajith Coomaraswamy
The Governor Central Bank of Sri Lanka,
Janadhipathy Mw,
Colombo 01.
24.10.2018

Dear Sir,

**Rectification of Pension Anomalies 2018**

Further to our letter dated 17.10.2018. Yesterday I spoke to Deputy Governor Mr. K.D.Ranasingha and he informed me that they have not considered any sort of updating. It means that the present management is deviating from the policy decided on the year 2015 of updating the pension. This decision surprised us. More than 90% of the pensioners are our members. We felt that the management was not considered the wish of majority and decisions were made on wish of minority views. I would like to mansion that from former Governors to Minor employees are members of our association.

Sir, we have explained our views at the discussion we had with you on 11th December 2017, and our letters dated 03rd May 2018 and 17th October 2018.And we met D.G.(R) thrice on 20th December 2017, 21st June 2018 and 11th October 2018. We are very much disappointed of the views expressed by the D.G.(R) yesterday when I phoned him.

Now we assume that you are trying to go back to percentage increases which we dropped in 2015. We do not know how you are going back to do this. We are interested to have your base year, at least. As all the pensioners who retired prior to year 2006 have been considered as if they have been retired in the year 2006. Sir, from the beginning we have been stated that there were lot of problems and some of the pensioners are getting lower pension than they should have availed. This is why we asked for the methodology bank used for updating pension to the year 2006. We went to the extent that we would drop the idea of asking for the methodology used in 2015 for the purpose of updating pension to 2006, if management decides to update pension to a designated year. It looks like that it is not going to happen. Under the right to information act, we can ask for this information which the bank was very reluctant to gives us. In numerous occasions we have asked the D.H.R. to give this information to us. However, now we will be compelled to do so.

Sir, we would like to have a discussion on this matter urgently, before this goes to the Monitory Board.

Thanking you.
Yours Faithfully

Jayalal Jayawardena
President
C.C.D.G. (R)
D.H.R.

Dr. Indrajith Coomaraswamy
The Governor Central Bank of Sri Lanka,
Janadhipathy Mw,
Colombo 01.
29.10.2018

Dear Sir,

**Pension anomalies**

Reference the discussion we had with you this morning (29-10-2018).

Thank you for granting us interview to discuss the above matter. Although we asked for the percentages that you have proposed to the Monitory Board to increase the pension, but we were not informed the percentages. We were made to understand that you have proposed a percentage increase to pensioners' who retired before the year 2000. However, we proposed to grant the same percentage to the all pensioners who retired before 2006.

When we informed you that the government has an intention to update the pension of government servants' pension to a designated year and we would accept the proposed increase on an interim basis which you agreed to consider.

We shall be much appreciated if you can consider the base year as 2006 for increase in pension this year because already pension had been updated to the year 2006.

Thanking you.
Yours Faithfully
Jayalal Jayawardena
President
C.C.D.G. (R)
D.H.R.



වැටුප් ප්‍රශ්නය පිළිබඳව නියෝජ්‍ය මහ බැංකු අධිපති රණසිංහ මහතා හමුවූ කමිටුව
(ඡායාරූපය කමිටු සහික ජගත් කාරියවසම්ගෙනි)

## ජගත් කාරියවසම් ගේ...

1 මිතුරා : උඹ දන්නවද පිටරටක මැෂින් එකක් හදලා තියෙනවා බොරුවක් කියන කොටම ඉරියව් මගින් සොයාගන්න පුලුවන්.

2 මිතුරා : ඕක මොකක්ද? උන් හදලා තියෙන්නේ එකයි. අපේ ලංකාව පුරාම තියෙන්නේ.

1 මිතුරා : ඈහ්: ලංකාවේ තියෙනවා

2 මිතුරා : ඔව් උඹ කසාදයක් බැඳලා බලපං, උඹට බොරුවක් කියන්න තියා කට හොල්ලගන්නවත් බැරිවෙයි.

# සිනා !



ගුරුතුමා : සෑම දෙයකටම සමාන ක්‍රියාවක් මෙන්ම ප්‍රතික්‍රියාවක් වූ ක්‍රියාවක් තියෙනවා. උදාහරණ කියන්න පුලුවන්ද

සිසුවා : පුලුවන් සර්
සෑම තැබෑරුමක් ලඟම වඩේ කරත්තයක් තියෙනවා.

1 මිතුරා : මගේ කෙල්ල මට හොඳට ගැලපෙනවා හිතන්නේ පතන්නේ එකම විදියට.

2 මිතුමා : අනේ වාසනාවන්. මේ කාලයේ ගැලපෙන දෙන්නෙක් හොයනවා කියන්නේ කලුනික හොයනවා වගේ.

1 මිතුරා : උඹ හරි ඊකිට මාව සතපහකට විශ්වාස නෑ. මටත් එහෙමයි.

## Laugh Lines by T. Wickramasinghe

The miserly old man was in his death-bed. He asks - "my wife" - I am here she says. "Kids" - yes daddy we are here they said. "Are all the family here" he asked, yes they said. Next question; "Why is the kitchen light on."

The murderer was told that the bad news was that the blood shows that the DNA proved he did it. The good news he said that his cholesterol is 130.

A young tourist went on a guided tour of a dirty old British castle. "Did you enjoy it" the guide asked. It was great she said, "I was afraid of ghosts in there. How long have you been here asked the girl. "Oh about 300 years."



# ඔක්කොම අපි එකතුවුනා...

# ග්‍රීන් හෝටලේ

**(වාර්ෂික එක්දින චාරිකාව)**

2018-09-22 දා යක්කල-වීරගැල **''අමායා ග්‍රීන්''** හෝටලයේදී තමයි ඒ එකතුව සිද්ධ වුනේ. එක බසයක් පිටත් වුනේ දෙහිවලින්. අනික රාජගිරියෙන්. කට්ටිය ඔක්කොම එකතුකරගෙන 9.30 ට විතර බස් දෙකම ''ග්‍රීන්'' හෝටලේට ගාල්වුනා.

හරිම ශාන්ත පරිසරයක්...

ශාලාවට ඇදුණු පිරිස් තමන්ට රිසි රිසි අය සමඟ තැන් තැන්වලට කුඩු වුනේ සතුටු සිනා මුහුණුවල පුරෝගෙන.



අපේ සංගීත කණ්ඩායම පරිසරය රසවත් කරමින් සප්තස්වරය එකතු කළා.

ගීත ගායනාද කෙමෙන් කෙමෙන් මතුවෙන්න පටන් ගත්ත. ගැයුම් වැයුම් වලට ටිකෙන් ටික නැටුම් ද එකතු වුනා.



හැම කෙනෙක්ම තම තමන්ගෙ අතීත මිතුරු මිතුරියන් එක්ක සතුටු සාගරයක ගිලිල.



මී විතත් ඒ අතරට එකතුවෙලා...



රස මස වුළු පිරි දිවා භෝජනයක් පසෙකින් සූදානම් වෙනව පෙනුන. හිතේ තිබුණු සතුටට කාටවත් බඩගිනි දැනුනෙ නැති වුනත් දිවා ආහාරයටත් පිරිස කෙමෙන් කෙමෙන් එකතු වුණා.



**දවසත් කෙමෙන් ගෙවිලා ගියා. සවස හතර විතර වෙනකොට කවුරු කවුරුත් බස්වලට ආපසු ගොඩවුනේ හිතේ දුකෙන් වගෙ....**

**ආයෙත් අපි හමුවෙන්නෙ කවදද කියල හිත හිතා.**



# "බොදු සිතට සිතන්නට යමක්...."

එක්තරා බෞද්ධ සංවිධානයක් මගින් මාස කිහිපයකට වරක් තම දායකත්වය සපයමින් ධර්ම දේශනා පවත්වනු ලබයි. එසේ පැවැත්වූ ධර්ම දේශනයක් බොහෝ සේ වැදගත් සහ විශේෂත්වයක් පෙන්නුම් කළ හෙයින් මෙසේ සැඳෑවට ලියා එවීමට සිතුවෙමි.

මෙම ධර්ම දේශනය සඳහා වැඩම කරනු ලැබුවේ එම ප්‍රදේශයේ පන්සලක වැඩ විසූ තරුණ භික්ෂූන් වහන්සේ නමක්ය. උන්වහන්සේ ඉතා කාරුණික ලීලාවෙන් ආරාධනය පිළිගෙන සිටින බව පෙනුණි. සංවිධායකයින් එම ආරාධනය දැනුම් දුන් පසුව ස්වාමීන් වහන්සේගෙන් ඡායාරූපයක් සහ තම තරාතිරම දරණ තනතුර ගැන විමසන ලද්දේ ධර්ම දේශනය පිළිබඳ අදාළ දැන්වීම්වල පළ කිරීමටය. එයට තම ගමේ නම සහ නම පමණක් ලබාදී ඇත්තේ ඊට වැඩි ප්‍රචාරණයක් අනවශ්‍ය බව පවසමිනි.

මෙසේ කිවයුතු දේ එක හෙලාම කෙලින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන් මෙම ස්ථානයේ පවත්වනු ලබන තමාගේ පළමු මෙන්ම අවසාන ධර්ම දේශනයද විය හැකි බවද සඳහන් කරන ලදි. උන්වහන්සේගේ ධර්ම දේශනය පුරා ප්‍රකාශ වූයේ බොදු බැතිමතුන් වශයෙන් කරන කටයුතු වලදී සිදුවුණ අඩු ලුහුඬුකම්ය.

<u>**එම අදහස් මෙසේ කැටිකොට දක්වමි.**</u>

බුදු දහමේ උගන්වනදේ පිළිබඳ මූලික අවබෝධයකින් තොරව කටයුතු කරන අය බොහෝ සිටිති. පෝය දිනයට සිල් සමාදන් වීම ඉතා හොඳය. එහෙත් තමා දන්නා හඳුනන පන්සලට නොගොස් දුර ඈත ලොකු පන්සලකට සිල් සමාදන් වීමට යාමට පුරුදු වී ඇත. එහි කෙරෙන චතාවත් ලැබෙන දානය පිළිබඳව මහා ආඩම්බරයෙන් කතා කරයි. මෙහිදී ඇතමුන් තම කෑම සරි කර ගැනීම සඳහා සිල් සමාදන් වන බවක්ද පෙනී යයි. සිල් සමාදන් වන දිනට පෙර දින තම දුරකථනය ගෙන යාමට සූදානම් කර ගැනීම මූලික කරුණකි. පෙර කාලයේ නම් තම ඇඳුම් සකස් කර ගැනීම අවශ්‍ය මල් පහන් තෙල් බුද්ධ පූජාව ආදිය සහ තම දවල් දානය පන්සලේදී සකස් කර ගැනීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සූදානම් කරගනියි. ඇතැම් විට ගම්වල තවමත් මේ ක්‍රමය පවතී.

පුරුදු පරිදි යන පන්සලේ බණ මඩුවේ තම හිඳින ස්ථානය කණ්ඩායම් ලෙස ස්ථාවර කර ගෙන සිටී. ඒ තම සිතැති පරිදි කතා බහ කිරීමට ඇසුරු කිරීමට පොහෝ දිනය යොදා ගැනීම නිසාය. ඒ අනුව පොහෝ දිනය පින් රැස් කිරීමට වඩා සිත දූෂණය කර ගැනීමට මග පෑදී ඇත.

පින්කම් දාන මාන කිරීමේදී ඇතමුන් ආරණ්‍ය සේනාසන වෙත පමණක් යාමට පුරුදු වී ඇත. තම ගමේ පන්සල මතක් වන්නේ පාංශුකූලය දීමට සිදු වූ විටය. එහිදී වෙනත් ලොකු පන්සල් වලින් හෝ ආරණ්‍ය වලින් වැඩම කිරීමට නොහැකිය.

අතීතයේදී නිවසක රාත්‍රී ධර්ම දේශනා පින්කමට සහභාගී වන්නන් හට අවසානයේදී යම් කැවිලි වර්ගයක් සහ කහට කෝප්පයක් පිළිගැන්වීමේ පුරුද්දක් තිබුනි. පින්කම් නිවසින් පිටත්වන ඔවුන් රාත්‍රී ආහාරය තම ගෙවල් වලින් ලබා ගනී.

ධර්ම දේශනය පැවැත්වෙන විට ඉතා අඩු සෙනගක් සිටී. දේශනය අවසන් වීමට විනාඩි 15 ක් පමණ තිබියදී මහත් සෙනග තද බද වී පැමිණේ. එම වේලාවටම රාත්‍රී ආහාර රැගෙන එන වාහනයද මහත් ඝෝෂාවක් නගමින් ලඟා වෙයි. එම ආහාර ද්‍රව්‍ය ආදිය පිළියෙල කරන ශබ්දය හේතුවෙන් ධර්ම දේශනය අවසානයේදී නිවසේ උත්සවාකාරයෙන් රාත්‍රී ආහාර සැපයීම සිදු වේ. මෙම තත්ත්වය නොනවතින රැල්ලක් සේ නගරයේ මෙන්ම දැන් ගම් වලටද බෝවී ඇත. තවද ඇතැම් විට ගෙදර සියළුම දෙනා පින්කම් ගෙදරට පැමිණෙන්නේ සීනි මුලක් වැනි සුළු දෙයක් ගෙන සැමගේ ආහාර වේල සපුරා ගැනීමටය. සංඝයා වහන්සේට පූජා කරන දෙයක් හෝ ගෙන එන්නේ නම් ඉතා වැදගත්ය.

උන්වහන්සේ යළි යළිත් මතක් කර දුන්නේ ආගමික කටයුතු වලදී දහමට මුල් තැන දී ඉතා සරලව අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමට සිත යොමු කිරීමට කාලය එළඹ ඇති බවයි. <u>මෙහිදී ධර්ම දේශනය මගින් ගාථා කීපයක් සහ කථාවස්තු යොදා ගෙන දහම් කරුණු ද පැහැදිලි කළ අතර ආගමික කටයුතුවලදී අප අතින් සිදුවන දුර්වලතා ගැන පැවසූ දේ පමණක් ඉහතින් සඳහන් කළ බව විශේෂයෙන් සඳහන් කරමි.</u>

**විමලා ධනපාල මිය (3108)**



# අපේ ඇත්තන්ගේ පොත පත

- **"RISING FROM THE ASHES"**

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකාවක් සහ චෙක්පත් නිශ්කාශනාගාරයේ කළමනාකාරිණියක් වූ නයනී ප්‍රනාන්දු සොයුරිය විසින් මහ බැංකු බෝම්බය ආශ්‍රිතයෙන් ලියන ලද **"RISING FROM THE ASHES"** නැමැති ග්‍රන්ථය නොබෝදා ඒ.එස්. ජයවර්ධන මහතාගේ දියණිය වන මේනකා ජයවර්ධන මහත්මිය වෙත පිළිගන්වනු ලැබීය. මහ බැංකු බෝම්බයෙන් වැනසුනු මහ බැංකුව ෆීනික්ස් පක්ෂියා අළු අතරින් නැගී සිටි අයුරින් යථා තත්ත්වයට පත් කිරීමේ මෙහෙයුමට නායකත්වය දුන් ඒ.එස් ජයවර්ධන මහතාට කරනු ලබන උපහාරයක් ලෙස මෙම ග්‍රන්ථය එළි දැක්වී ඇත.

මිල රු. 300/- ක් වන මෙම ග්‍රන්ථය විජිත යාපා පොත් හලෙන් මිලදී ගත හැක.

- **"TALE OF TWO COUNTRIES"**

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට අනුබද්ධ දත්ත සැකසුම් අංශයේ ජ්‍යේෂ්ඨ වැඩ සටහන් සම්පාදක වරයකු සහ සහකාර කළමනාකරුවකු වූ අජිත් කනගසුන්දරම් සොහොයුරු විසින් රචිත **"TALE OF TWO COUNTRIES"** නම්වූ ග්‍රන්ථය නොබෝදා දොරට වැඩුණි. බැංකු ක්ෂේත්‍රය පිළිබඳව මෙන්ම ක්‍රෙඩිට් කාඩ් ඉතිහාසය පිළිබඳව ද වටිනා තොරතුරු රැසක් මෙහි ඇතුළත්ය. විජිත යාපා පොතත් හලෙනන් මිලදී ගත හැකි මෙම ග්‍රන්ථයේ මිල රු. 280/- ක් වන අතර මින් ලැබෙන ආදායම යුද්ධයේදී මියගිය අයගේ දරු පවුල් වෙත ලබා දීමට කතුවරයා තීරණය කර ඇත.

- **ග්‍රාමීය ව්‍යවසායකයාගේ සන්නිවේදන කුසලතාව සහ ජාත්‍යන්තර වෙළඳපොල 2017**

සේවක අර්ථ සාධක දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී වරයකු ලෙස සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ සහකාර විනිමය පාලකවරයකු ලෙස සේවය කළ කේ.එම්.එච්.බී. මැදගම සොහොයුරු විසින් විවිධ ක්ෂේත්‍රයන් අරභයා පසුගිය කාලය තුළ වටිනා ග්‍රන්ථ කිහිපයක්ම එළිදක්වා ඇත.

- වෙළඳ ප්‍රචාරණය 2009
- ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් නෝට්ටුවල ඉතිහාසය සහ සන්නිවේදන ලක්ෂණ 2009
- යාපහුව කලා ශිල්ප (සන්නිවේදන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයකි) 2009
- ග්‍රාමීය ව්‍යවසායකයාගේ සන්නිවේදන කුසලතාව සහ ජාත්‍යන්තර වෙළඳපොල 2017 (නවතම ග්‍රන්ථය) ප්‍රකාශනය ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම

- **''කරාටේ මතක සටහන්''**

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ සහකාර ගණකාධිවරයකු ලෙස සේවය කළ නමගිය කරාටේ ශූරයකු වූ එම්.බී.ඩී. සිල්වා සොහොයුරු විසින් රචිත ''කරාටේ මතක සටහන්'' නමැති ග්‍රන්ථය අලෙවිය සඳහා රු. 400/- ක මිල නියම කර ඇති මුත් අවශ්‍යතාවයක් ඇති මහ බැංකු විශ්‍රාමිකයනට එම පොත නොමිලේ දීමට සිල්වා මහතා කැමැත්ත පළකොට ඇත. ඒ සඳහා ඔහුගේ දුරකථන අංක 0775219373 විමසන්න.

- **''මා දුටු සුන්දර ගම තෙලඟපාත''**

වාණිජ ලෝකය හමුවේ දිනෙන් දින වැනසෙන සුන්දර ගම් පියසක් පිළිබඳව නියෝජ්‍ය ගණකාධිකාරීවරයකු ලෙස සේවය කළ ජේ ජයවර්ධන විසින් රචිත **''මා දුටු සුන්දර ගම තෙලඟපාත''** නම් ග්‍රන්ථය සහ එහි **ඉංග්‍රීසි පරිවර්තනයද** බන්දුල විමලසූරිය සොහොයුරා වෙත කෙරෙන විශේෂ ''පිදුමක්'' ලෙසින් එළිදක්වා ඇත.


ඒ බව ඔහුගේ වදනින්...

මෙම පොත කියවා, එහි වරද නිවැරදිකර මහත් උත්සාහයක් දැරූ බන්දුට මගේ පොත ගෞරවයෙන් පිරිනමමි. පොත පාඨශාලා පුස්තකයක් වශයෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පිළිගැනීම බන්දුගේ උත්සාහයේ ප්‍රතිඵලයකි.





# එන්න යන්න…
# අපිත් එක්ක…
# ති..රි..කු..ණා..ම..ලේ..

**(වාර්ෂික තුන්දින චාරිකාව)**



අපේ ''මහ ගෙදර'' අපේ ඇත්තො එක්ක සොබාදම් මාතාවගේ ලස්සන විඳගන්න මෙන්න තවත් හොඳ අවස්ථාවක්…

අපේ **වාර්ෂික තුන්දින චාරිකාව** අපේ ලස්සන පුංචි රටේ ලස්සනම දිසාවට… ඒ කියන්නෙ ගලේ කොටුව බැන්ද ත්‍රිකුණාමලේට…



සේරුවිල.. තිරියාය.. කෝනේෂ්වරම් කෝවිල ලවර්ස් ස්ලිප්… නිලාවෙලි වෙරළ… වගේ තැන් විතරක් නොවෙයි. ගමන් මඟ ඇති තවත් තැන් තියෙනවා බලන්න. පවුලේ දූ දරුවන් සමඟ රටතොට ඇවිදගන්න තිබෙන තවත් හොඳ අවස්ථාවක් තමයි මේ. අපේක්ෂිත වකවානුව

## 2019 මාර්තු මුල් සතියේ..

දිනය පසුව දැනුම් දෙමු.

අනික් කටයුතු වෙනුවෙන් වෙන්වන දින අතරට **මේ සතියත් වෙන්කර තබාගෙන ඒ සියල්ල කල්තියා සැලසුම් කරගන්න හැකි වෙන්නයි මෙම අපේක්ෂිත වකවානුව කලින්ම ඔබවෙත දැන්නුවේ.**

## පූජා…

### සුවිශේෂ දානමය පිංකමක්…

1996 මහ බැංකු බෝම්බයෙන් මියගිය අප සොයුරු සොයුරියන් හට පිංපතා සහ එම ඛේදවාචකයෙන් තුවාල ලත් අනිකුත් සොයුරු සොයුරියන් වෙත සෙත්පතා මහරගම අපේක්ෂා රෝහලේ (පිලිකා රෝහල) රෝගීන් වෙත **මාර්තු 23, 24, 25, 28, 29, 30, 31** යන දිනවල දිවා ආහාරය සැපයීමට අප සංගමය තීරණය කොට ඇත.

ඒ පිළිබඳ සංවිධාන කටයුතු මහරගම පිළිකා සරණ සංගමය හා එක්ව සිදුකෙරෙන අතර හැකි අයුරින් එම අවස්ථාවන්ට සහභාගීවන මෙන් ඔබ සැමටද ගෞරවයෙන් ආරාධනා කරමු. (වැඩි විස්තර : 0774035536/0112478580 - උප ලේකම් - ශ්‍රදාණා රණතුංග)

## මුතුකුඩයට එක්වෙමු…

අප සංගමයෙන් ඉටුවන සේවාවන් වඩාත් ප්‍රතිඵලදායක ලෙසත් පුළුල් ලෙසත් ඉටුකිරීමට අප සංගමය තව තවත් ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. අප සංගමයේ කටයුතු වලට එක්වීමෙන් පුද්ගලිකව ලද හැකි සතුට ප්‍රබෝධය පිළිබඳව මෙන්ම පොදුවේ ලද හැකි සේවය පිළිබඳව අපේ ඇතැම් සහෝදර විශ්‍රාමිකයින් අනවබෝධයෙන් සිටීම කණගාටුවට කරුණකි. ඔවුන් අතින් මේ ගිලිහෙන්නේ ජීවිතයේ වටිනාම හෝරාවක් බව ඔවුනට නොවැටහීම මීට හේතුවයි.

සබඳ, මෙම ඉදිරි වර්ෂය අපේ මුතුකුඩයට රොක්වන වර්ෂය ලෙස හඳුන්වමු. සංගමයට නොබැඳුණු ඔබේ හිතවතුන් හිතවතියන් සිටී නම් මෙම ''සැඳෑව'' කලාපය ඔවුන් අතට පත්කරන්න. ඔවුන් අපේ සාමාජිකයන් කිරීමට උත්සාහ කරන්න.

**ඔබ එක් සාමාජිකයෙකු සංගමයට කැඳවා ගෙන එන්න. එය හොඳටම ප්‍රමාණවත්ය.**

# කෘත ගුණ සලකමු…



හිටපු මහ බැංකු අධිපතිවරයකු වූ **ආචාර්ය නෙවිල් කරුණාතිලක** ශ්‍රීමතාණන්ට පිං පිණිස **2019 පෙබරවාරි 28** වෙනි දින ප.ව. 4.30 ට බෞද්ධයා රූපවාහිනී නාලිකාවේ දහම් දේශනාවක් පැවැත්වේ.

මෙම ධර්ම දේශනාව මානෙල් සන්නස්සූරිය මහත්මියගේ යෝජනාවක් පරිදි එතුමියගේ මූලිකත්වයෙන් සහ සංවිධායකත්වයෙන් සිදුකෙරේ. මෙම කටයුත්ත ඒ සඳහා දායකවීමට කැමති අයගේ **පෞද්ගලික දායකත්වය මත පමණක්** සිදුකෙරෙන අතර සංවිධාකයින්ට පහසුවක් වන පිණිස ඒ සඳහා දෙනු ලබන පුද්ගලික ආධාර **සංගමය මාර්ගයෙන් එක්රැස්කර දීමට** කටයුතු යොදා ඇත.

ඊට දායකවීමට ඔබ කැමැත්තේ නම් ඔබගේ මුදල් ආධාරය **2019 පෙබරවාරි 15** දිනට ප්‍රථම මහ බැංකු විශ්‍රාමික සංගමයට අයත් හැටන් නැෂනල් බැංකු නගර ශාඛාවේ අංක 002010016134 දරණ ගිණුමට තැන්පත් කර, අදාළ කුවිතාන්සියේ පිටපතකක් ඔබගේ නම හා විශ්‍රාමික අංකය සඳහන් කොට R.D. ගුණසේන, 364/A, ජිනසේන මාවත, මහර කඩවත යන ලිපිනයට තැපැල් කර එවන්න. මෙම කටයුතු සඳහා සංගමයද සහභාගී වන අතර ඔබගේ පැමිණීමද සංවිධායකයින් අපේක්ෂා කරයි. මෙම ධර්ම දේශනාවට අවශ්‍ය මුදල් ප්‍රමාණයට වඩා මුදල් එකතු වුවහොත් එම මුදල්, ආධාර අවශ්‍ය විහාරස්ථානයක් වෙත පූජා කිරීමට සංවිධායකයින් අපේක්ෂා කරයි. ධර්ම දේශනය **2019-04-10** දින විකාශය වේ.

විමසීම් : **R.D. ගුණසේන** - 0718026411
**ජයලාල් ජයවර්ධන** - 0777412289
**මානෙල් සන්නස්සූරිය** - 0718190235

# විශ්‍රාම වැටුප...

අපගේ විශ්‍රාම වැටුප පිළිබඳව සංගමය පාලක පක්ෂය වෙත යොමුකළ ලිපි හා පාලක පක්ෂය සමග කළ සාකච්ඡා පිළිබඳ **2018-11-10** දින දක්වා වූ තොරතුරු මෙම කලාපයේ **13, 14, 15, 16, 17** පිටුවල සවිස්තරව දක්වා ඇත. එතැන් සිට විශ්‍රාම **වැටුප් වැඩිවීමේ ප්‍රතිශතයන්** පිළිබඳ **ස්ථිර තොරතුරු ලිඛිතව** ලබාගැනීමට අප උත්සාහ කළ අතර මේ දක්වා එම විස්තර අපවෙත නොලැබුණි.

ඒ අතර එම වැඩිවීම්වලට අනුකූලව 2018 ජනවාරි මස සිට විශ්‍රාමිකයින්ට ලැබිය යුතු හිඟ මුදල් ඔබගේ ගිණුම්වලට මීට දින කිහිපයකට පෙර බැරකොට ඇති බව දැනගන්නට ලැබුනි. එකී වැඩිවීම්වලට අදාළ ප්‍රතිශතයන් පිළිබඳ විස්තර අපවෙත ලැබුණු පසු ඔබවෙත සැපයීමට බලාපොරොත්තු වෙමු.

# සැඳෑවේ පමාව...

සැඳෑව මෙවර කලාපය ඔබ අත පත්කිරීම මෙතෙක් පමාවීම ගැන කණගාටු වෙමු. ඊට ප්‍රධාන හේතුව වූයේ කාලීනව ඉතා වැදගත් වූ එමෙන්ම ඔබ ඕනෑකමින් බලාපොරොත්තු වූ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය පිළිබඳ අලුත්ම තොරතුරු උපරිම ප්‍රමාණයකින් මෙම කලාපය තුළින් ඔබවෙත දැනුම්දීමට බලාපොරොත්තු වීමයි.

තවද, සැඳෑවේ පලකිරීමට අවශ්‍ය ප්‍රමාණයට නිර්මාණ නොලැබී තිබීමත් එම නිර්මාණ ලබාගැනීමට කාලය ගතවීමත් සැඳෑවේ පමාවට බලපෑ තවත් කරුණක් විය.

සැඳෑවේ මීලඟ කලාපය ඉතා ඉක්මනින් ඔබවෙත නිකුත් කිරීමට බලාපොරොත්තු වන අතර ඔබගේ නිර්මාණ **හැකි ඉක්මනින් අප වෙත එවන්න**. එය සැඳෑව වෙනුවෙන් ඔබට ඉටුකළ හැකි **ලොකුම උපකාරයයි.**

<u>සැඳෑවට ලිපි</u> :

**හේමසිරි ෆර්ඩිනෑන්ඩු,** සැඳෑව සංස්කාරක,
**28/35/7, බුද්ධාලෝක මාවත, සුවාරපොළ, පිළියන්දල**.

# සෑඳෑව

**ඔබගේ නිර්මාණ අපේක්ෂාවෙන් සිටියි.**

**ඔබගේ පැරණි සොයුරු සොයුරියන් සමඟ ගතින් හමු නොවී සිතෙන් දොඩමළු වෙන්න පුළුවන් එකම මග තමයි සැඳෑව.**

**සැඳෑවේ පලවන ලිපි ගැන ඔබේ විමසුම්-ඔබේ කවි-ඔබේ කථා-අදහස්-උදහස්-අත්දැකීම්-නව තොරතුරු-යෝජනා....**

**ඔය ඕනම දේකට සැඳෑව විවෘතයි.**

**''සැඳෑව'' ඔබ දිවියේ ''සැන්දෑවට'' රස ඔසුවක්**

''තම අතීතයට ගරු කරන ආදරය කරන අයෙක් වේද ඔහු සැබවින්ම සංතෘෂ්ඨිමත් මිනිසෙකි.''

ජෝන් ලියෝ


රටා නිමැවුම සහ සංස්කරණය
**හේමසිරි ෆර්ඩිනෑන්ඩු**

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
2018 ජූලි - සැප්තැම්බර් කලාපය

වෙබ් අඩවිය : www.sedewa.org

සෑදෑව සන්දාව

අංක : QD/83/News/2016 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදි.



ගරු සභාපති
ජයලාල් ජයවර්ධන
අංක.02, තිස්ස මාවත, දෙහිවල.